# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට ටොන් 03 ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර 06 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

**IFB අංකය - SRS F.8036**

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, තැ.පෙ.355, කොළඹ වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපතිවරයා විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ටොන් 03 ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර 06ක් සැපයීම වෙනුවෙන් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරීත්ව ලංසු පටිපාටිය (NCB) අනුව සිදු කෙරෙනු ඇත.

3. උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට **පෙ.ව.9.00** සිට **ප.ව.3.00** දක්වා සතියේ දිනයන්හිදී පහත දක්වා ඇති ලිපිනයෙන් වැඩි දුර තොරතුරු ලබාගැනීමට සහ ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකිය.

   **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය),**
   **දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
   **ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**
   **දුරකථන අංක** : **+94 (11) 2438078 හෝ +94 (11) 2436818**
   **ෆැක්ස් අංකය** : **+94 (11) 2432044**
   **ඊ මේල්** : **srs.slr@gmail.com**
   **වෙබ් අඩවිය** : **www.railway.gov.lk**

4. ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර සැපයීම සම්බන්ධයෙන් වසර 10 ක පළපුරුද්දක් සහිත සහ පසුගිය වසර 10ක කාලය තුළ ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර 20ක්වත් අලෙවි කර ඇති සහ අවම වශයෙන් වසර 05ක් අදාළ නිෂ්පාදකයාගේ දේශීය නියෝජිතායතනය සහිත ලංසුකරුවන්ට මේ සඳහා ලංසු ඉදිරිපත් කළ හැකි ය.

   සමාන සන්නාමයක් සහිත ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර නිෂ්පාදනයේ සහ සැපයීමේ ලා වසර 10ක පළපුරුද්ද සහිත නිෂ්පාදකයන්ට සහ ෆෝක් ලිෆ්ට් යන්ත්‍ර සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම සඳහා ප්‍රතීතනය ලත් ISO 9001:2008 තත්ත්ව සහතිකය වීම මේ සඳහා ලංසු ඉදිරිපත් කිරීමේ යෝග්‍යතා අවශ්‍යතාවයකි.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.10.03** සිට **2024.10.28** දක්වා **ප.ව.3.00** තෙක් නැවත ගෙවනු නොලබන **රු.6,650.00** ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය, ඕල්කොට් මාවත, කොළඹ 10 යන ලිපිනයට යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය

6. සියලුම ලංසු සමග වටිනාකම **රු. 300,000.00** වූ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක බැංකුවක් විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් ලෙසට වූ ලංසු ඇපකරයක් බැගින් තිබිය යුතුය.

7. **2024.10.29 ප.ව.2.00** හෝ එදිනට පෙර පහත ලිපිනයට ලංසු එවිය යුතු අතර, ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. මෙම ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

   **සභාපති,**
   **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
   **ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
   **ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
   **ඕල්කට් මාවත, කොළඹ 10.**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**

**යොමු අංක : SRS/ F.8036**